## වාරිමාර්ග අමාත්‍යාංශය

# පුරප්පාඩු

# මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

## අරමුදල් ප්‍රභවය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යනු 2024 වන වසරේදී සම්පූර්ණ කිරීමට නියමිත ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් සහනදායි ණය පහසුකම් සහිතව වාරිමාර්ග අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන මහවැලි බහු කාර්ය සංවර්ධන වැඩසටහන හි මහා සැලැස්මෙහි (Master Plan) හි කොටසකි.

**අයදුම්පත් :**

යථා යෝග්‍ය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලබන අතර, අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත් සිය **ජීවදත්ත තොරතුරු ප්‍රකාශ (CV) සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ද, අදාළ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත්ද සමග පහත ලිපිනයට 2022.03.28 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ** ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වන අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. මෙයට අමතරව අයදුම්කරුවන් විසින් එම අයදුම්පතම ඉදිරි පිටපතක් ලෙසින් ඊමේල් ලිපිනය : hr.mwsip@gmail.com ලිපිනයට පිටපත් කරමින් pdadbproject@gmail.com වෙත යොමු කළ යුතුය. **එම ඊමේල් ලිපිනයේ විෂය රේඛාවේ අයදුම් කරන තනතුර සටහන් කළ යුතුය.**

**වැඩසටහන් අධ්‍යක්ෂක,**
**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන,**
**අංක 493-1/1, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තු ගත කරනු ලබන අයදුම්කරුවන්, සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, කුසලතා පදනම මත සුදුස්සන් තෝරාගනු ලැබේ. එසේ හෙයින් **බඳවා ගැනීම් ක්‍රියාවලිය සඳහා බලපෑම් කිරීම හෝ නියෝජනයන් ඉදිරිපත් කිරීම, අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම කෙරෙහි බලපානු ලබනු ඇත.** මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතු වන අතර, සියලු අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලවල / සංස්ථාවල හෝ වෙනත් රජයේ ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතු වන අතර, එම ප්‍රධානීන් විසින් අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් මසක් ඇතුළත පූර්ණකාලීනව දැනට දරන තනතුරින් මුදා හැරිය හැකිද යන වග සඳහන් කර එවිය යුතුය.

| තනතුර හා රැකියා පැතිකඩ | සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|
| **01. සාමාජීය හා ව්‍යාපාර සංවර්ධන නිලධාරී (PS-05)**<br>**රැකියා පැතිකඩ**<br>● ව්‍යාපෘතියේ ජීවනෝපාය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා ආසියානු සංවර්ධන බැංකුවේ සහ ශ්‍රී ලංකා රජයේ මාර්ග නිර්දේශන යටතේ එය ව්‍යාපෘතියේ සමාජ ආරක්ෂණ සංරචකය සහතික කිරීම පිණිස උපයෝගී කොට ගැනීම.<br>● ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ (PAPs) ආදායම් මාර්ග පවත්වාගෙන යාමට පහසුකම් වැඩි දියුණු කිරීම සහ ඔවුන් නැවත පදිංචි කිරීමෙන් පසු ඔවුන්ගේ ජීවනෝපාය නැවත ස්ථාපිත කිරීම.<br>● බලපෑමට ලක්වූ පුද්ගලයන්ගෙන් (PAPs) ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම, ඔවුනගේ රැකියා අවස්ථා ප්‍රවර්ධනය සහ වඩාත් යහපත් ජීවන තත්ත්වයක් සඳහා රජය හා වෙනත් සංවිධාන සමග සබදතා වැඩි දියුණු කිරීම.<br>● මූල්‍ය හා සමාජ විනය වර්ධනය කිරීම හා බලපෑමට ලක්වූ පුද්ගලයන් (PAPs), ප්‍රජා සංවිධාන සහ අදාළ වාණිජ මණ්ඩල සමග අනුසන්ධානගත වීම.<br>● ජීවනෝපාය ක්‍රියාකාරකම් සඳහා අදාළ වාර්තා සැකසීම. | ✳ **පහත දැක්වෙන සුදුසුකම් කලමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 ට අනුකූල විය යුතුය.**<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව UGC විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සාර්ථකව සම්පූර්ණ කර තිබීම.<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන වෘත්තියවේදී සුදුසුකමක්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම<br>**සහ**<br>විශේෂඥතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 6 ක පළපුරුද්ද.<br>2. අදාළ ක්ෂේත්‍රයේ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br>විශේෂඥතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 11 පළපුරුද්ද.<br>3. අදාළ ක්ෂේත්‍රයේ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br>විශේෂඥතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද<br>✳ (**වැටුප් තලය :** PS5 **රු. 105,000.00 - රු. 113,000.00)** |
| **02. තාක්ෂණ නිලධාරී - නඩත්තු (PS 06 - ප්‍රවර්ගය බී)**<br>**රැකියා පැතිකඩ**<br>● සියලුම ගොඩනැගිලි හා වාහන නඩත්තු කටයුතු සඳහා සම්බන්ද ලිපි ලේඛන පිළියෙල කිරීම හා මෙහෙයවීම හා තාක්‍ෂණ ඇගැයීම් කමිටුවේ (TEC) සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.<br>● ගොඩනැගිලි, උපකරණ හා වාහන නඩත්තුව හා හොද තත්ත්වයෙන් පවත්වාගෙන යාම සුපරීක්ෂාකාරීව පිරික්සීම.<br>● PMU හි සියලුම සිවිල් ඉංජිනේරු නොවන කාරණා හා ගැටලු සඳහා ඉල්ලා සිටි විටකදී සහභාගි වීම.<br>● PMU හා PLUs හි සියලුම වාහන හොද ධාවන තත්වයෙන් නඩත්තු කිරීම.<br>● ඉහත සඳහන් කාර්යයන්ට සම්බන්ධ පිරිවිතරයන් ඇතුළු මිල ගණන් කැඳවීමේ ලිපි ලේඛන සම්පාදනය.<br>● ප්‍රවාහන අංශයට සම්බන්ධ සියලුම කරුණු කාරණා සඳහා සහභාගි වීම. | ✳ **පහත දැක්වෙන සුදුසුකම් කළමනාකාර සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 ට අනුකූල විය යුතුය.**<br>1. තාක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br>විශේෂඥතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.<br>2. තාක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලන තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 6 මට්ටමට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br>විශේෂඥතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද.<br>3. තාක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br>විශේෂඥතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.<br>✳ **(වැටුප් තලය** PS6 **ප්‍රවර්ගය** B **රු. 56,000.00 - 58,000.00)** |

✶ MSD චක්‍රලේඛ අංක 01/2019 පරිදි ඉහත වැටුප්වලට අමතරව ජීවන වියදම් දීමනාවද ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි**

01. අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.
02. සියලුම නිලධාරීන් අදාළ රජයේ ආයතන හා වෙනත් නියෝජිතායතන සමග සම්බන්ධව හා සම්බන්ධීකරණයෙන් යුක්තව සහයෝගයෙන් යුක්තව සිය රාජකාරී සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.
03. ශ්‍රී ලංකාවේ, විදේශ අරමුදල් ප්‍රතිපාදන ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.
04. ඉහත තනතුරු සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, රජයේ නීති රීති, රෙගුලාසි හා හුරු පුරුදු බව සහ පරිගණක සාක්ෂරතාව, අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවයන් වනු ඇත.
05. සේවා / රැකියා කොන්ත්‍රාත්තු එක් වසරක කාල සීමාවකට හා වැඩසටහන්වල / ව්‍යාපෘතිවල අවශ්‍යතාවයන් හා කාර්ය සාධනයන් මත පදනම්ව වාර්ෂිකව නැවත අලුත් කරගත හැකි ඒවා වනු ඇත.
06. රජය අනුමත කර ඇති වැටුප් පරිමාණයන් හා දීමනාද සමග වැටුප් හා දීමනා කළමනාකරණ සේවා චක්‍රලේඛ (MSC) අංක 01/2019 සහ ඉන් පසු සංශෝධිත චක්‍රලේඛ පරිදි වනු ඇත. (http://www.treasury.gov.lk)

**ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය.**